ඇමුණුම් අංක - 02 ආකෘතිය

## 1. ලංසුකරුවන්ට උපදෙස්

1.1 වසර වසර දෙකක කාල සීමාව සඳහා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාතර්මේන්තුවේ, පහත දැක්වෙන ප්‍රාදේශීය හා දිස්ත්‍රික් කායර්ාල සඳහා කුලී පදනම මත ගොඩනැගිලි ලබා ගැනීම සඳහා දෙපාතර්මේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් මිල ගණන් කැඳවනු ලැබේ.

1.අලව්ව
2.කෝට්ටේ

1.2 නිසි පරිදි සම්පූර්ණ කරනු ලැබූ අයදුම් පත්‍රය පිටපත් දෙකකින් පිළියෙල කර ඉදිරිපත් කරන ලංසු අයදුම්පතේ (ඇමුණුම් අංක 1 ආකෘතිය) මුල් පිටපත හා අනුපිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම ලියුම් කවර වල බහා කවර දෙක එක කවරයක් තුල බහා සීල් තබා පහත සඳහන් ලිපිනයට 2021.08.20 දින ප.ව. 2.00ට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ කායර්ාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලීමට කටයුතු කළ යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඔබ ගොඩනැගිලි සැපයීමට අදහස් කරන කායර්ාලයේ නම ලියා **"කුලී පදනම මත ගොඩනැගිලි සැපයීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. නිසි පරිදි ආකෘති පත්‍ර සම්පූර්ණ කර මිල ගණන් ඉදිරිපත් කළයුතු ලිපිනය ගණකාධිකාරී (ප්‍රසම්පාදන), ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාතර්මේන්තුව, අංක 1200/6, මිහිකත මැදුර, රජමල් වත්ත පාර, බත්තරමුල්ල වේ.

1.3 ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගෙන අවසන් වූ වහාම ලංසු විවෘත කිරීම සිදු කරනු ලබන අතර, එම අවස්ථාවට ඔබ හෝ ආයතනයේ නියෝජිතයකුට සහභාගී විය හැක.

1.4 මිල ගණන් කැඳවනු ලබන්නේ වසර දෙකක කාල සීමාවක් සඳහා වේ. වැට් බදු සඳහා ලියාපදිංචි ආයතනයක් නම් ලංසු පත්‍රය සමඟ ඉදිරිපත් කරනු ලබන මිලගණන් වැට් බදු රහිතව සඳහන් කර වැට් බදු වෙනම දැක්විය යුතුය. වැට් බදු ලියාපදිංචි අංක ලංසු පත්‍රයේ සඳහන් කළ යුතුයි.

1.5 ලංසු ලියවිලි වල සටහන් කරන ලද යම් දෙයක් කපා හෝ මකා වෙනස් කළහොත් ඒ සෑම ස්ථානයකම ලංසුකරු කෙටි අත්සන හා දිනය යෙදිය යුතුය.

## 2. විශේෂ කොන්දේසි

2.1 ඉදිරිපත් කරන මිලගණන් දින 60 ක් සඳහා වලංගු විය යුතුයි.

2.2 ඔබගේ ගොඩනැගිල්ල ලබාගැනීමට දෙපාතර්මේන්තුව තීරණය කර ප්‍රදාන ලිපිය නිකුත් කළ දින සිට සතියක් ඇතුලත දෙපාතර්මේන්තුව සමඟ ගිවිසුමක් අත්සන් කළ යුතුයි.

2.3 ගොඩනැගිල්ල සඳහා ලංසුකරුට නිරවුල් අයිතියක් තිබිය යුතු අතර, ඔබගේ ගොඩනැගිල්ල ලබාගැනීමට තෝරා ගැනීමෙන් පසු හිමිකම් සම්බන්ධව අදාල ලේඛන වශයෙන් ඉඩමේ ඔප්පුව සහ ගොඩනැගිල්ලේ අනුමත සැලැස්ම ඉදිරිපත් කිරීමට හැකි විය යුතුයි.

2.4 ගොඩනැගිලි කුලියට ගැනීම සඳහා වන යම් ලංසුවක් හෝ සියළුම ලංසු ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් සතු වේ.